**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**4 සතිය**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 6.1.3. ජෝර්ජ් කීට් ශිල්පියාගේ නිර්මාණ අගයමු |

**<u>ඉගෙනුම් ආධාරක</u>**

**ජෝර්ජ් කීට්**

- ක්‍රි.ව. 1901 අප්‍රේල් 17 වන දින මහනුවර අම්පිටියේ දී සිංහල බර්ගර් පවුලක උපත ලැබීය.
- මහනුවර ත්‍රිත්ව විදුහලෙන් මූලික අධ්‍යාපනය ලබා ඇත.
- ඔහු 43 කණ්ඩායමට අයත් චිත්‍ර ශිල්පියකු වන අතර ගෝතමී විහාරයේ බිතුසිතුවම් ද නිර්මාණය කර ඇත.
- ඔහු තම සිතුවම් නිර්මාණවලට හින්දු කලා ආභාසය හා යුරෝපයේ පැබ්ලෝ පිකාසෝගේ ඝනිකවාදී චිත්‍ර ශෛලියේ කලා ආභාසය සහිත ව ඔහුටම ආවේණික චිත්‍ර ශෛලියක් නිර්මාණය කරගැනීම දැකිය හැකි ය.
- ජෝර්ජ් කීට් ශිල්පියා සිතුවම් නිර්මාණයේ දී රේඛාවට ප්‍රධාන තැනක් ලබා දී ඇති අතර එම රේඛා
- ඍජු රේඛා, කෙටි රේඛා, වක්‍ර රේඛා වශයෙන් හඳුනාගත හැකි ය.
- නිතැතින්ම ගලායන ජීවමය ගුණයෙන් යුතු රේඛාවෙන් රූපවල පිරුණු බව ඉස්මතු කර ඇත.
- රතු, සුදු, දුඹුරු, කහ, නිල්, කොළ යන වර්ණ භාවිත කරමින් සියුම් ලෙස ත්‍රිමාන ලක්ෂණ මතු කර ඇත.
- මෙම සිතුවම් වියළි බදාමයේ අඳින ලද බිතුසිතුවම් ක්‍රමය වන ෆ්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට නිර්මාණය කර ඇත.

**ගෝතමී විහාරයේ බිතු සිතුවම්**

- මහමායා දේවිය දුටු සිහිනය
- සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය
- සරණ මංගල්‍ය
- නළඟනන්ගේ විකාර දැකීම
- සතර පෙර නිමිති දැකීම
- මාරපරාජය






**මාරපරාජය**

- ගෝතමී විහාරයේ සිතුවම් අතර සුවිශේෂී සිතුවමක් ලෙස සැලකෙන 'මාර පරාජය' හින්දු කලා ලක්ෂණ හා පිකාසෝගේ ඝනිකවාදී ශෛලීය ලක්ෂණ ආභාසය කර ගත් නිර්මාණයකි.
- ඝනිකවාදී හැඩතල භාවිත කිරීමෙන් මාරසේනාවේ මුහුණුවල රුදුරු භයංකර විලාසය මැනවින් ඉස්මතු කර ඇත.
- මාර පිරිසට දුඹුරු, අළු, කළු වැනි අඳුරු වර්ණත් බුදුන්වහන්සේ සඳහා අඳුරු කහ, ලා දුඹුරු වැනි වර්ණත් යොදා ගනිමින් ත්‍රිමාන ලක්ෂණ සහිත ව සිතුවම වර්ණවත් කර ඇත.
- රූප වටා පරිපූර්ණත්වය හා නිමාව පෙන්වන නිර්මාණශීලී රේඛාකරණය ඔහුට ම ආවේණික වූවකි.

ලබා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

1) ජෝර්ජ් කීට් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2 ජෝර්ජ් කීට්ගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න



- හඳුනාගත් බව : ........................................................
- ශිල්පියා : ........................................................
- ශිල්ප ක්‍රමය : ........................................................
- වර්ණ භාවිතය : ........................................................
- ශිල්පීය කුසලතා: ........................................................

**<u>ඇගයීම</u>**

1) ජෝර්ජ් කීට් ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්නග

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

3) ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ යුරෝපීය හා හින්දු කලා සම්ප්‍රදායන්ගේ ආභාසය විස්තර කරන්න

4) ජෝර්ජ් කීට් ශිල්පියාගේ ප්‍රධාන සිතුවම් 3ක් ගෙන හඳුනාගත් බව, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න